**විපක්ෂ නායක - ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව**
எதிர்க்கட்சித் தலைவர் - இலங்கைப் பாராளுமன்றம்
**LEADER OF THE OPPOSITION - PARLIAMENT OF SRI LANKA**

# <u>මාධ්‍ය නිවේදනයයි</u>

කිතුනු බැතිමතුන්ගේ අති පූජනීය දිනයක් වන පාස්කු ඉරිදා දින සිදු වූ අවාසනාවන්ත ප්‍රහාරයන් මාලාව දැඩි පිළිකුලෙන් යුතුව හෙළා දකිමු.

ම්ලේච්ඡ ත්‍රස්තවාදය නිමා කොට රටේ ආරක්ෂාව තහවුරු කර තිබියදී ජාතික ආරක්ෂාව වෙනුවෙන් කැපවී සිටින බුද්ධි අංශ නිලධාරීන්, ත්‍රිවිධ හමුදා නිලධාරීන් ඇතුළු ආරක්ෂක අංශ අඩපණ කිරීමේ අනිටු ප්‍රතිවිපාක විඳින්නට සිදුව ඇත්තේ අහිංසක ජනතාවටය. මෙවන් තත්වයකට රට යළි ඇද දැමීම පිළිබඳ වත්මන් රජයට දැඩි ලෙස විරෝධය පල කරන්නෙමු.

රටේ ඇති වෙමින් පවතින අනාරක්ෂිත තත්වයෙන් රට මුදා මුදාගැනීමේ වගකීම රජය වහාම ඉටු කල යුතු බවද අවධාරණය කරමින් ශෝකයට පත් කිතුනු පවුල් වලටත්, සමස්ත කිතුනු ජනතාවටත්, කම්පනයට පත්ව සිටින සියලුම ශ්‍රී ලාංකික ජනතාවටත් ශෝකය පලකිරීමට මෙය අවස්ථාවක් කරගනිමින්. අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් සමඟ ශෝකය බෙදා ගන්නෙමු.

මේ කණගාටුදායක අවස්ථාවේ ඉතාම සාමකාමීව කටයුතු කරන ලෙසත්, කුමන්ත්‍රණකාරීන්ගේ ක්‍රියාවන් වලට හසු නොවන ලෙසත් සමස්ථ ජනතාවගෙන් ඉල්ලීමට මෙය අවස්ථාවක් කර ගනිමු.

**මහින්ද රාජපක්ෂ**
ගරු විපක්ෂ නායක
2019 අප්‍රේල් මස 21 දින.